# නුවණක්කාර කුමාරයා

**T.M.N.G.කවිෂ්ක ප්‍රමෝද්‍ය බණ්ඩාර**

# නුවණක්කාර කුමාරයා

**T.M.N.G.කවිෂ්ක ප්‍රමෝද්‍ය බණ්ඩාර**

**කතෘ**

**පාසල- මා/බුද්ධඝෝෂ ජාතික පාසල- පලාපත්වල- මාතලේ**

**ශ්‍රේණිය - 7 C**

**කෘතිය පළකරන දිනය - 2025-02-08**

## විදුහල්පතිගේ ප්‍රකාශය

වත්මන් ගෝලීයකරණය වන ලෝකයේ දරු දැරියන් කියවීමෙන් දුරස්ව සිටින ස්වරූපයක් දක්නට ලැබෙන අවස්ථාවක මහනුවර මහාමායා විද්‍යාලය මඟින් පවත්වනු ලබන හෙරණගත්කරණී වැඩසටහන පැසසුමට ලක්කරමි.

දුවා දරුවන්ගේ නැණස වර්ධනය කරන මෙවැනි වැඩසටහන් ඉදිරියටත් සිදු කිරීමට අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

එමෙන්ම මා/බුද්ධඝෝෂ ජාතික පාසල නියෝජනය කරමින් වැඩසටහනට සහභාගි වන දරු දැරියන්ට සුභාසිංශන එක් කරමි.

A.J.අතුල සහම්පත්

විදුහල්පති

මා/බුද්ධඝෝෂ ජාතික පාසල

## නියෝජ්‍ය විදුහල්පතිනියගේ ප්‍රකාශය

හෙරණගත්කරණී වැඩසටහන මහතලා පුරවරයන් දිරිපත් වන දුවා දරුවන්ට සුභාශිංෂණය පිරිනමන අතර නූතන සමාජය තුළ සාහිත්‍ය රස වනිදනය කිරීම මිනිස් සමාජය තුළින් ක්‍රමයෙන් ඈත් වෙමින් පවතින කාල සීමාවක මහමායාවේ දියණිවරුන් විසින් සිදු කරන හෙරණගත්කරනේ වැඩසටහන තුළින් අප රටේ ශ්‍රේෂ්ඨ ගත්කරුවන් බිහිවේවායි ප්‍රාර්තනාකරමි.

R.M.S.P.K.රත්නායක

නියෝජ්‍ය විදුහල්පති

# පිදුම

මා මෙලොවට උපන් දා සිටම මා වෙනුවෙන් දිවා රෑ නොබලා මා හැදූ වැඩූ දෙමාපියන්ටත්

අප පාසලේ පුස්තකාලාධිපතිතුමිය වන  මනෝදර ගුරු මෑණියන්ටත්

අප පාසලේ නියමුවානන් වන අතුල සහම්පත්  විදුහල්පතිතුමාටත්

මෙම පොත පුදමි !

# පෙරවදන

තම නුවණ  මෙහෙයවා ජීවිතයට එන අභියෝග ජයගත් ඉවාන් කුමාරයා ආදර්ශයට ගෙන අපිත්  බුද්ධිමත්ව කටයුතු කරමු.

- කවිෂ්ක ප්‍රමෝද්-

# නුවණක්කාර කුමාරයා

එකෝමත් එක ගමක  දුප්පත් ගෙයක් හා පොහොසත් ගෙයක් තිබුණා. දුප්පත් ගෙදර අම්මයි, තාත්තයි පුතයි ජීවත් වුණා.  ඒ පුතාගේ නම ඉවාන්. පොහොසත් ගෙදර ජීවත් වුණේ රජ පවුලට නෑකම් කියන පිරිසක්. ඒ නිසා මේ ගොල්ලෝ ටිකක් නම්බුකාරයි. ඒ ගෙදරත් අම්මයි ,තාත්තයි ,පුතයි ජීවත් වුණා. ඒ ගෙදර පුතාගෙ නම නිසාම්. මේ ගෙවල් දෙකේ ළමයි ටික ටික ලොකු වුණා. ඊට පස්සෙ දුප්පත් ගෙලදර තාත්තා හිතුවා පුතාව ලොකු ගුරුවයක් ගාව පුතාව නවත්තලා උගන්වන්න. ඊට පස්සේ  එයා ගෙවල්වල වැඩකරලා කොහොමහරි මුදල් හොයාගෙන පුතාව නේවාසිකව ඉගෙනගන්න තැනකට දැම්මා. මේක දැකපු පොහොසත් ගෙදර අම්මාට පපුව පැලෙන්න තරම් ඊර්ෂ්‍යයා හිතුණා.  ඊට පස්සෙ එයා ඒ ගෙදර තාත්තට කතා කරලා මෙහෙම කියනවා.

‘‘අර දුප්පත් ගෙදර ළමයාවත්  හොඳ නේවාසිකව ඉගනගන්න තැනකටද දාලා. අපි අපේ පුතාවත් ඒ තැනටම දාගන්න ඕන. ’’ කියලා ඊට පස්සේ ඒ ගෙදර තාත්තා කියනවා ‘‘අපි අපේ පුතාවත්  අදම එතනට ගිහින් දාමු’’.

ඒ වුණාට මේ වැඩේට ඒ ගෙදර පුතා නිසාම් කැමති නැහැ. එයාට ඕන උදේ ඉඳන් රෑ වෙනකන් සෙල්ලම් කරන්න.  කොහොමහරි මේ දෙන්නා නිසාම්ට

තරවටු කරලා නේවාසිකව ඉගෙන ගන්න තැනට ගිහින් දැම්මා. නිසාම් හුඟක් දඟ නිසා ම කිහිපවතාවක් ගුරුගෙදරින් එළියට පැනලා දිව්වා. කොච්චර ගුරු ගෙදර හිටියත් නිසාම් හරියට ඉගෙන ගත්තේ නැහැ. මෙහෙම ටික කාලයක් ගතවුණා ගුරුතුමා ගුරු ගෙදර සිටින සියලු ළමයින්ව කැඳෙව්වා. ඊට පස්සෙ මෙහෙම කිව්වා.

"දැන් ඔබලා සියලු ශිල්ප ශාස්ත්‍ර හදාරා අවසන්. හෙට උදෑසනින්ම ශිල්ප පෙන්වන පිටියට ගොස් සියලු දෙනාම තමන් දන්නා ශිල්ප පෙන්විය යුතුයි. " පසුදින උදා විය. සියලු දෙනාම ශිල්ප දක්වන පිටියට ගොස් සිටිති. ගුරුතුමා පැමිණියේ ය. " දැන් සියලු දෙනා තමන් දන්නා ශිල්ප දක්වන්න." ගුරුතුමා ප්‍රකාශ කළේය. ටිකෙන් ටික නිසාම්ගේ වාරයද ළඟා විය. නිසාම් තමන් දන්නා ශිල්ප පෙන්වීය. අවසාන වාරය ලෙස තිබුණේ ඉවාන්ගේ වාරයයි. ඉවාන් අති දක්ෂ ලෙස තමන්ගේ හැකියාව පෙන්වීය. ගුරුතුමාගේ හිත ඔහු වෙත ඇදී ගියා. මෙවර දක්ෂතම සිසුවා ලෙස ඉවාන් තේරුනා. ඊට පස්සේ ගුරුතුමා සිසුන් කැඳවා මෙසේ කීය.

"මෙවර දක්ෂතම සිසුවා ලෙස ඉවාන් තේරුණා. " අනිත් අයත් හොඳට තමන්ගේ දක්ෂතා පෙන්නුවා. මීළඟට මම කියනවා මෙරට සිට රටවල් තිහකට එහා ඒ කියන්නේ තිස්එක්වැනි රටේ නපුරු භයංකාර මායාකාරයකුගේ ගෙදරක් තියෙනවා. ඒ ගෙදර මායා කඩුවක් තියෙනවා. මේ කඩුව ගේන කෙනා

තමයි  මේ රට අයිති කර ගන්නේ. ඒ කඩුව ගේන්න ගියපු බොහෝ  දෙනෙක් අතරමං  වෙලා  මායාකාරයාට ගොදුරු වෙලා තියෙනවා.  මම ඔයාලට අවුරුදු පහක කාලයක් දෙන්නම් මේ වැඩේ කරන්න.  අද ගෙදර ගිහිල්ලා සතියක් විවේක ගන්න. සිසුන් තම තමන්ගේ නිවෙස් වලට ගියේය. නිසාම් ගුරුතුමා කී කතාව දෙමාපියන්ට කීය. ඊට පස්සේ නිසාම්ගෙ පියා මෙසේ කීය.

"ඔය වගේ  දෙයක් ගන්න ගිහිල්ලා ජීවිතය විනාශ කරගන්නවට වඩා හොඳයි ගෙදර හිටියනම්. මම රජතුමාට කියලා පුතාට රජකම අරන් දෙන්නම්. " නිසාම්ගෙ අම්මා  කපටි තැනැත්තියක් නිසා ඈ මෙහෙම කිව්වා.

"අපි ඕකට ඉවාන්ව අල්ලලා දීලා අපේ පුතාව යවමු කඩුව ගන්න වැඩේට. සමහර විට  ඔය කඩුව ගත්තොත් පුළුවන් වෙයි එයාව මරලා රජකම ගන්න." මේ කතාව  අහගෙන හිටිය නිසාම් මෙහෙම කිව්වා.

"මමත් අම්මා කිව්ව කතාවට කැමතියි. ඔය ඉවාන් හරි මෝඩයිනේ. අනික දුප්පත් හින්දා කැමති වෙයි. "

ටික දවසක් ගත වුණා. නිසාම් කෑම බීමත් අරගෙන ඉවාන්ගේ ගෙදර ගියා. ඊට පස්සෙ රජකම ගන්න එක ගැන කිවුවා. ඉවාන් බොහෝම බුද්ධිමත්ව පිළිතුරු දුන්නා.

“ගුරුතුමා කිව්වෙ හැමෝම ඒකට යන්න කියලා. එතකොට එක්කෙනෙක් නොගියාම ඒක ගුරුතුමාගේ සිතරිදීමක් නේද?”

ඊට පස්සෙ නිසාම් මෙහෙම කිව්වා.

ඔයා අකැමතියි නම් කමක් නෑ. මම කිව්වෙ ඔය කට්ටියට පෙහොසත් වෙන්නත් එක්කයි.

ඊට පස්සෙ නිසාම් මේ ගැන අම්මාට කිව්වා. අම්මා මෙහෙම කිව්වා. “ ඕක ගැන පුතා බයවෙන්න එපා. මම කියන්නම් කරන්න ඕන දේ. ඔයා පිරිසක් එක් කරලා ගමන යන දවසට තියා ගන්න. දිශා බෙදලා හැමෝම යද්දී ඔයා ඉවාන් ගිය පැත්තට යන්න. අර පිරිසට ඉවාන් යන පැත්තේ කොහේ හරි හැංගිලා ඉන්න කියන්න. එතකොට ඉවාන් ඒ පිරිස ගාවින් යද්දි ඒ පිරිස ඉවාන්ව වටකරගෙන පහර දෙයි. මේ කතාව නිසා නිසාම්ගෙ සිතට ලොකු සතුටක් දැනුනා. ගමනට පිටත්වන දවස එළඹුණා. සිසු පිරිස ගුරුතුමා ළඟට ගිහිල්ලා ආචාර කරලා දිශාවලට බෙදිලා ගමන් පිටත් වුණා. නිසාම් ටික දුරක් ගොස් ඉවාන් ගිය පැත්තට ගියා. නිසාම් තමන් පස්සෙ එන බව ඉවාන් දැක්කා. ඉවාන් තමන් ගිය දිශාව මාරු කලා. මෙහෙම ගිහිල්ලා ඉවාන් ගඟක් ළඟට ආවා. පාරුවක් තියගෙන මිනිසෙක් සිටියා. ඉවාන් මිනිසා ළඟට ගිහිල්ලා කතා කරලා ඒ පාරුවෙ නැගලා එගොඩ බලා යාත්‍රා කළා. නිසාම් කරකියා ගන්න දෙයක් නැති වුණා. හිරු බැස යන්නට ළංවුණා. නිසාම් තනිව මූකලං කැලෑව මැදින් ගමන් කළා.

ඇස්වලට උල් වලින් ඇන්නත් පේන්නෙ නැති තරම් කරුවල වුණා. නිසාම් තමන් ළඟ තිබුණු ගිනිගල් දෙකක් අතුල්ලා දර කැබැල්ලක් ගිණි පන්දමක් සේ සකස් කර ගත්තා. ඔහු ඉවාන්ට පහරදෙන්න යවපු පිරිස හිටිය පාරේ ඔහු කරවලේම නොදැනුවත්වම ගමන් කරමින් සිටියා. මේ වෙලාවෙ අර පිරිස රැකගෙන සිටියි. නිසාම් එතනින් ගියා පමණි. ඔහුට ඉන් එහාට අඩියක්වත් තියන්නට බැරි විය. අර පිරිස ඉවාන් යයි සිතා නිසාම්ට පිට පිටම පොලු පහර එල්ල කලේය. යන්තම් එළියක් කන්ද උඩින් පැන නැග්ගේය. එවිට නිසාම් නැගිටින්නට තියා ඇඟිල්ලක්වත් ඔසවන්නට බැරි තරම් ඔහුගේ අස්ථි බිඳී ගියේය. මෙය දැකපු පිරිස නිසාම් ඔසවාගෙන ඔහුගේ මව ළඟට රැගෙන ගියේ ය. ඉන්පසු නිසාම්ට මාස පහක පමණ කාලයක් ප්‍රතිකාර කරන්නට සිදු විය. මේ අතරේ ඉවාන් විසි හත්වෙනි රටේ සිටියි. නිසාම්ට යන්තම් සුවය ලබුනා පමණි. නිසාම් ඔහුගේ සුළඟ වගේ වේගයෙන් යන අසු සමඟ නැවත ගමන යාමට පිටත් විය. මෙසේ කාලය ගෙවුණි. ඉවාන් දැන් තිස්වෙනි රටේ සිටියි. නිසාම් සිටින්නේ තවම විසිතුන්වෙනි රටයි. මේ රටේ සිටින දක්ෂ මායාකාරියක් නිසාම්ට සම්මුඛ වූවාය. මායාකාරිය මේ ගැන අසාදැනගෙන නිසාම්ට කෙටි මාර්ගයක් කියාදුනි. එයින් ඔහු විසි නවවැනි රටට ඉතා ඉක්මණින් පැමිණියේය. ඉන් පසුව ඔහුට ගඟක් හමුවුණි. මේ ගඟෙන් එගොඩට යාමට කිසිම මාර්ගයක් නැත. එක විසඳුමක් පමණක් ඇත. ඒ මෙගොඩ සිට එගොඩට පිහිනීමයි. නිසාම් එම කාර්යය කිරීම සඳහා ගඟට පැන්නේය. ඔහු කෙසේ හෝ එගොඩට ගියේය. ඉවාන් සෑම

අභියෝගයක්ම ජයගෙන තිස් එක්වැනි රටේ සිටියි. නිසාම් ද ගඟන් එගොඩ වී තිස් එක්වැනි රටේ සිටියි. ඉවාන් යනකොට යනකොට මූකලන් කැලෑවක් මැදින් යාමට සිදුවිය. ඔහු කැලැව මැදින් ගමන් කරන විට අමුතු භයංකාර ගෙයක් හමුවිය. ඔහු ගෙය ළඟට යන විටම නිදිමත දැණුනි. ඔහු කෙසේ හෝ නොනිදා ඒ ගෙය අසලටම පැමිණියේ ය. ඔහුගේ නිදිමත ඔහුට නොනිදා සිටිමට නොහැකි තරම් වැඩි විය. තමන් තවත් එතන සිටියහොත් මායාකාරයාට ගොදුරුවන බව ඔහුට හැගුණි. ඔහු කැලෑවේ වෙන දෙසකට ගමන් කලේය. ඔහු ගමන් මහන්සිය නිසා ගසක් යට හිදගත්තා පමණි. එතනින් මහලු පූජකයෙක් ගියේය. ඔහු ඉවාන්ට අවවාදයක් දුනි.

“ඔබ කිරීමට අදහස් කරන්නේ මොකක්ද කියලා මම දන්නවා. ඔයා ඔය යන ගමන බොහොම අනතුරුදායකයි. ඔයාට එය කඩුව ගන්න ඕන නම් කළු රාක්ෂයා නිදහස් කරන්න ඕන.” නපුරු මායාකාරයා කළු රාක්ෂයාව දම්වැලි පන්සියකින් බැඳලයි තියෙන්නෙ. කළු රාක්කෂයා දැනටමත් අවුරුදු දහයක් වතුර නොබී ඉන්නවා. ඔහු මායාකාරයගේ ගබඩා කාමරයේ ඉන්නවා. හෙට උදෑසනින්ම ඔබ නැගිටින්න. ටිකක් වෙලා ඉන්නකොට මෙතනින් කොටියෙක් යාවි. ඔබ ඒ කොටියා පස්සෙන්ම යන්න. හබැයි කොටියට නොපෙනි ඔය කොටියා යන්නේ මායාකාරයා ගෙදර නැති වෙලාවට. ඔය කොටියා මායාකාරයගෙ ගෙදර පිටිපස්සට ගියාට පස්සෙ අතුරුදහන් වෙයි. සමහර විට

මායාකාරයා ගෙදර ඉන්නත් පුළුවනි. ඊට පස්සෙ ඔයා තැනට සුදුසු නුවණ පාවිච්චි කරන්න. ඊට පස්සෙ ඒ මහලු පූජකයා යන්න ගියා. ඉවාන් උද්‍යෑසනින්ම නැගිට්ටේය. ටිකක් වෙලා ගියායට පසු එතනින් කොටියා ගියේය. ඉවාන් කොටියා පස්සෙන් ගියේය. මායාකාරයාගේ පිටිපස්සට යනකන් ඇවිත් අතුරුදහන් වුණි. පිටිපස්සෙ දොර වසා තිබුණි. ඒ නිසා ඉවාන් ඉස්සරා පැත්තට ගියේය. දොර බාගෙට ඇර තිබුණි. ඉවාන් හිමින් ගොස් දොර ඇරියේය. එහෙත් අවාසනාවකි. මායාකාරයා ගෙදර සිටියේ ය. ඉවාන් තමන්ගේ කඩුව ගත්තේය. මායාකාරයා ඔහුව කරුණාවෙන් ඇමතුවේය.

“ආ. . ඉවාන් කුමාරයා. . . . . කැමැත්තෙන් මෙහාට ආවද අකමැත්තෙන් ආවද?”

ඉවාන් කිසිවක් නොකියා තමන්ගේ කඩුව ගෙන මායාකාරයාට පහරදීමට සූදානම් වුණි. මායාකාරයාද තමන් ඉදගෙන සිටි තැනින් නැගිට තමන්ගේ මායාකඩුව අතට ගත්තේය. ඉවාන් තමන්ගේ කඩුවද රැගෙන මායාකාරයාගේ ඇගට පැන්නේ ය. මායාකාරයා මායා කඩුවෙන් ඉවානගේ කඩුවට එක පහරක් එල්ල කළේය. ඉවාන්ගේ කඩුව දෙකට බිදුණි. ඉන් පසු මායාකාරයා මෙසේ කිය.

“තමුන්ට මාත් සමඟ සටන් කිරීමට නොහැක. තමුන් මෙහාට පැමිණි වේලාවෙහි මා තමුනට කරුණාවෙන් කතා කළා. ඒත් තමුන්කලේ වැරදි වැඩක්. ” ඒ නිසා තමුන්ට අවුරුදු පහක සිර දඬුවමක් ලැබෙනු ඇති.

එසේ කියා මායාකාරයා අතුරුදහන් වුණි. ඉන් පසු මායා කුරුල්ලකු පැමිණ ඉවාන්ගේ දෙවුරෙන් අල්ලාගෙන කරුවල කුටියකට රැගෙන ගොස් අතහැර දමා ගියේ ය. ඒ කුටියේ එක බිත්තියක ගඩොල් කැටයක් නැති පොඩි සිදුරක් විය. ඉවාන් කුමාරයා ඒ සිදුරෙන් එළිය බැලිය. කළු රාක්ෂයා දම්වැල් පන්සියකින් බැඳ සිටින බව ඔහු දුටුවේ ය. ඉවාන් මිටියකින් බිත්තියට ගැසුවේ ය. එක පහරකින් ම බිත්තිය දෙබෑ වුණි. ඔහු කළු රාක්ෂයා සිටින ගබඩා කාමරයට ගොස් එහි දොර විවෘත කළේය. ඉන් පසු කළු රාක්ෂයා කතා කළේ ය.

"ඉවාන් කුමාරයා මට වතුර බාල්දි තුනක් ගෙනත් දෙන්න. මම ඔයාට ඕන කරන දේ දෙන්නම්. මොකද මේ හැමදේම මට අයිති දේවල්."

ඉවාන් කුමාරයා හිමින් පොළවට අඩිය තිය තිය ගොස් මායාකාරයාගේ කුස්සියට ඇතුළු වී වතුර බාල්දි තුනක් පරවා ගත්තේ ය. ඉන් පසු එය කළු රාක්ෂයාට ගොස් දුණි. ඔහු වතුර බාල්දි තුනම එක හුස්මට බිව්වේය. ඔහුට නැවත සවි ශක්තිය ලැබුණි. ඔහු දම්වැල් පන්සියම කඩා දමා මෙසේ කිය.

"ඉවාන් කුමාරයා ඔබ මට ලොකු උදව්වක්කළා. ඔබට ඕන දේ කියන්න මම ඔබට එය දෙම්."

"මට ඔබගේ මායා කඩුව දෙන්න."

කළු රාක්ෂයා කැමති වුණි. මායාකාරයා ගෙදරට පැමිණියේ ය. ඔහුට කළු රාක්ෂයා නිදහස් කර ඇති බව හැගුණි. ඔහු මායා කඩුවත් රැගෙන ගබඩා කාමරය අසලට පැමිණියේ ය. ඔහු පුදුම වුණි. දම්වැල් පන්සියම කෑලිවලට කැඩී ඇත. ඉවාන් කුමාරයා නැත. බිත්තිය දෙබෑ වී ඇත. මේ අතරේ කළු රාක්ෂයා මායාකාරයාගේ ඇගට පැන්නේය. මායාකාරයා තමන් දන්නා සියලු ශිල්ප වලින් කළු රාක්ෂයාට ප්‍රහාර කළේය. කළු රාක්ෂයාට කිසිවක් නොවීය. ඔහු තව තවත් ශක්තිමත් විය. කළු රාක්ෂයා මායාකාරයාගෙන් මයා කඩුව උදුරා ගෙන ඔහුගේ පපුවට ඇන්නේය. මායාකාරයා මැරී වැටුණෝ ය. මේ සිද්ධිය බලාගෙන සිටි ඉවාන් දුවගෙන ඇවිත් කළු රාක්ෂයාට ස්තූති කළේ ය. ඉන්පසු කළු රාක්ෂයා තමන්ගේ මායාකඩුව ඉවාන්ට භාරදුනි. ඉවන් කළු රාක්ෂයාට සමුදී තමන්ගේ මවු රටට යෑමේ ගමන පිටත් වුණි. නිසාම් කෙසේ හෝ ඉවාන් මායා කඩුව අරගත් බව දැනගෙන පූජකයෙක් ලෙස වෙස් වලාගෙන ඉවාන් එන පාර මැදට ගොස් මෙසේ කිය.

“ඔබ කෙසේ හෝ මායාකාරයාගෙන් මායා කඩුව ගත්තා. ඒත් ඔය මායාකාරයා ඒ වෙලාවේ මැරුණාට පසුව ඔහුට පණ ලැබෙනවා. ඒ නිසා ඔය කඩුව මට දෙන්න”

කමක් නෑ පූජක තුමනි කරදරයක් උනොත් මම බේරෙන්නම්.

නිසාම් එතනින් ඉක්මනට ගොස් පූජක ඇදුම් ගලවා තමන්ගේ ඇදුම් ඇදගත්තේ ය.

ඉන්පසු පිරිසක් කැඳවා ඔවුන්ට නියෝගයක් කළේ ය.

“ ඔබ සියලු දෙනා ඉවාන් පසුපස යන්න. ගිහිල්ලා ඔහුව අල්ලා ගන්න. ඊට පස්සේ ඔහුට ගහල මායාකඩුව ගන්න. ඊට පස්සෙ ඔහුව මරා දමන්න. දැන්ම යන්න. ” ඉවාන් දැන් ගඟක් ළඟට පැමිණ ඇත. ගඟ ළඟ පාරුවක් තියාගෙන මනුස්සයෙක් ඉන්නවා. ඉවාන් ඔහු ළඟට යන්න හදන කොටම අර පිරිස ඔහුගේ ඇගට පැන්නා. ඉවාන් මායා කඩුවෙන් ඒ පිරිසේ සියලු දෙනාම මරා දැම්මා. ඊට පස්සේ ඉවාන් පාරුවෙන් එගොඩට ගියා. කාලය ගෙවුණා. නිසාම් හා ඉවාන් මවුරටට පැමිනියා. ඉවාන් එක් දවසක උදෑසනින් ම තම ගුරුවරයාගේ ගෙදර ගියා. එතන ඉවාන් සමඟ ඉගෙන ගත්තු සියලු දෙනා හිටියා. ගුරුවරයා එතනට ආවා.

“ ළමයිනේ ඔයාලා එක්කෙනෙකුටටවත් බැරි වුණා මායා කඩුව ගේන්න. හැබැයි ඉවාන් ඒක ගෙනාවා. ඉවාන් එදත් දක්ෂයා අදත් දක්ෂයා. ඉවාන් ඔයා රජතුමත් එක්ක සටන් කරනන්. ඔබට දිනන්න පුළුවන්. ”

“මට රජතුමාගේ මහා සේනාවත් එක්ක සටන් කරන්න පුළුවන් වෙයිද? ” මායා කඩුව තියෙන නිසා දිනන්න පුළුවනි. දැන්ම පිටත් වන්න. ඉවාන් දූතයකු යවා අදම සටනට එන්නැයි රජතුමාට දැන්වීය. රජතුමා ඉක්මණින් සේනා සංවිධානය කොට සටනට ගියේ ය. රජකිසිම සේනාවක් නැතිව තනිව සිටින ඉවාන් දැක සිනා උනේය.

රජ ඉවාන්ව මරණ මෙන් මහා සේනාවට කීය. සේනාව ඉවාන්ව වට කරගෙන ඔහුගේ ඇගට පැන්නේය. සේනාව ටිකෙන් ටික අඩු වනවා දුටු රජු පුදුම විය. ටිකක් වෙලා ගියේය. ඉවාන් රජතුමාගේ මහා සේනාව සහමුලින් ම විනාශ කළේය. මේ බව දුටු රජතුමා බිය වී තම අසු පිට නැග අසු පැන්නුවේය. ඉවාන් ඔහු පසු පස පන්නාගෙන ගොස් මායා කඩුව රජුගේ ඇගට විසි කළේය. එය කැරකී ගොස් රජුගේ කොන්දේ ඇනිණි. රජ මැරී අසු පිටින් වැටුණේය. මිනිසුන් බොහෝ ඇවිත් ඉවාන්ට රජකම භාරගන්නා ලෙස ඉල්ලා සිටියේ ය. ඉවාන් කැමති විය. ඉවාන් රජකම භාර ගන තම මවුපියන්වද රජමාලිගාවේ ගෙනත් තබාගෙන සතුටින් ජීවත් වුණි.

# පසුවදන

